# 11 බස් එකේ යමු

වෑන් එක තව ම නෑ නේ? අදත්, මග දී කැඩිලා ඇති.

අපි කොහොම ද ගෙදර යන්නේ?

තුන් දෙනා ම බස් එකේ යමු.

මාමේ, අපිට උදව්වක් කරන්න පුළුවන් ද?

කියන්න පුතා, මොකක් ද?

පාලංගමට යන බස් එක කොහේ ද නවත්වන්නේ?

අන්න අතන බස් නැවතුමට යන්න.

බස් එක නවත්වන්නේ

එතන.

ඒක යන්නේ කීයට ද?

තුනට විතර.

එහෙනම්

ඉක්මනට යමු.





මේ බස් එකේ පාලංගමට යන්න පුළුවන් ද?

පුළුවන්, නගින්න.

පාලංගමට ටිකට් එකක් කීය ද?

රුපියල් පහළොවයි.

ටිකට් තුනක් දෙන්න.

ආ මෙන්න ටිකට්.

මාරු සල්ලි තියෙනවා ද?

නෑ, රුපියල් පනහයි, තියෙන්නේ.



නොමිලේ බෙදාහැරීම සඳහා ය.

එහෙනම් ඉතුරු සල්ලි බහින කොට ගන්න.

ඉස්සරහට යන්න.

කොන්දොස්තර මහත්තයා, අපි ඉස්සරහ බහිනවා.

අපි ඉතුරු සල්ලි ගත්තේ නැහැ.


ආ, මෙන්න.

බහිමු, බහිමු.

අන්න අන්න, අයිස්ක්‍රීම් මාමා.

අපි අයිස්ක්‍රීම් කමු ද?

අනේ! මා ළඟ සල්ලි නැනේ.



මා ළඟ තියෙනවා.

අයිස්ක්‍රීම් එකක් කීය ද?

එක එක ගණන්වලට

තියෙනවා.

අපිට අයිස්ක්‍රීම්

තුනක් දෙන්න.

මොන අයිස්ක්‍රීම් ද ඕනේ?

මට වැනිලා අයිස්ක්‍රීම්.

මටත් වැනිලා අයිස්ක්‍රීම්.

ඔයාට මොනවාද ඕනේ?

මට චොක්ලට් අයිස් ක්‍රීම්.

ආ, මෙන්න අයිස් ක්‍රීම්. කාට ද චොක්ලට් අයිස් ක්‍රීම් එක?

මට දෙන්න.

අන්න, ඔයාගේ තාත්තා ඇවිල්ලා.

පුතාලා දැන් ද ආවේ?

ඔව්, දැනුයි ආවේ.

තාත්තේ මෙයා මට

බස් එකට ටිකට් ගත්තා.

කොච්චර හොඳ ද? අරයා කාත් එක්කද යන්නේ?

මට තනියෙම යන්න පුළුවන්.

එහෙනම් පරිස්සමින් යන්න පුතා

## වචන මාලාව

නෑ නේ - இல்லையே

අදත් - இன்றும்

කොහොම ද? - எப்படி ?

බස් එකේ - பஸ் வண்டியில்

උදව්වක් - உதவி

පුළුවන් ද? - முடியுமா?

කොහේ ද නවත්තන්නේ - எங்கே நிறுத்துவார்கள்

අන්න අතන - அதோ, அங்கே

තුන් දෙනාම - மூன்று பேரும்

ටිකට් එකක් - டிக்கட் ஒன்று

දෙන්න - தாருங்கள்

මාරු සල්ලි - சில்லரை காசு

ඉතුරු සල්ලි - மிகுதி காசு

බහිනකොට - இறங்கும்போது

මා ළඟ - என்னிடம்

| | |
|---|---|
| අයිස්ක්‍රීම් | - ஐஸ்பழம் |
| ගන්න | - எடுங்கள் |
| මට | - எனக்கு |
| මටත් | - எனக்கும் |
| ඔයාට | - உங்களுக்கு |
| කාට ද? | - யாருக்கு |
| ඇවිල්ලා | - வந்து |
| මෙයා | - இவர் |
| අරයා | - அவர் |

## ක්‍රියාකාරකම 01

**පින්තූරය බලමු. අඩු අකුරු කියමු. ලියමු.**

*படத்தைப் பார்ப்போம். இடைவெளி நிரப்புவோம்.*

1. වෑ ....................................



2. බ ....................................



3. රු ....................................



4. අ ....................................



5. කො ................................



## ක්‍රියාකාරකම 02

**යා කරමු. කියවමු.**

இணைப்போம் , வாசிப்போம்

| | |
|---|---|
| යන්න | අකැමැති |
| කැමැති | අඩුයි |
| වැඩියි | මෙතන |
| බහින්න | එන්න |
| අතන | සෙමින් |
| ඉක්මනින් | නගින්න |



නොමිලේ බෙදාහැරීම සඳහා ය.

## ක්‍රියාකාරකම 03

**ගළපමු. කියවමු. ලියමු.**

ஒழுங்குபடுத்துவோம், வாசிப்போம், எழுதுவோம்.

1. මග දී/වැන් එක/කැඩිලා/අදත් ..........................................
2. පුළුවන්/උදව්වක්/අපට/කරන්න/ද ....................................
3. පුළුවන්ද බහින කොට/ ගන්න/ ඉතුරු/සල්ලි ..................
4. ටිකට්/දෙන්න/පාලංගමට/තුනක් ....................................
5. නවත්තන්නේ/බස් එක/කොහේ ද ....................................

## ක්‍රියාකාරකම 04

**පිළිතුරු කියමු. ලියමු.**

விடை கூறுவோம், எழுதுவோம்.

1. දරුවන් දිනපතා පාසල් යන්නේ කොහොම ද? ..................
2. ඔවුන් පදිංචි වී සිටින ගමේ නම කුමක් ද? ..............................
3. එදින වැන් එක ආවේ නැත්තේ ඇයි? ...............................
4. දරුවන් ගෙදර ගියේ කොහොම ද? .................................
5. ඔවුන් කෑවේ මොනවා ද? ...............................................

## ක්‍රියාකාරකම 05

**වාක්‍ය ගළපා දෙබස ගොඩනගන්න.**

**பின்வரும் வாக்கியங்களை கொண்டு உரையாடல் ஒன்றை அமைக்குக.**

ඔව්, තියෙනවා.

කීය ද?

ආ... මෙන්න පැන්සල් පෙට්ටියයි ඉතුරු සල්ලියි.

පාට පැන්සල් තියෙනව ද?

රුපියල් එකසිය පනහයි.

මෙන්න සල්ලි.

ළමයා :- ........................................................................................

මුදලාලි :-........................................................................................

ළමයා :- ........................................................................................

මුදලාලි :-........................................................................................

ළමයා :- ........................................................................................

මුදලාලි :-........................................................................................



නොමිලේ බෙදාහැරීම සඳහා ය.